# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

**India's National Spiritual Newspaper**

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

**Editor : S. SAM SELVA RAJ**

16 Languages

Vol. XVI YEAR OF OUR LORD JESUS CHRIST, JULY 2022 Issue No. 8


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 30 : 1-10)**

1. ස්වාමීනි, ඔබ වර්ණනාකරමි. මක්නිසාද ඔබ මා උසස්කළසේක, මාගේ සතුරන්ට මා සඳහා ප්‍රීතිවෙන්ට නුදුන්සේක.

2. මාගේ දෙවිවූ ස්වාමීනි, ඔබට මොරගැසීමි, ඔබද මා සුවකළසේක

3. ස්වාමීනි, ඔබ ෂෙයෝලෙන් මාගේ ආත්මය ගොඩගත්සේක. මා වළට නොබසින පිණිස මාගේ ජීවිතය ආරක්ෂාකළසේක

4. ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි, උන්වහන්සේට ප්‍රශංසා ගී කියව්, උන්වහන්සේගේ ශුද්ධ වූ නාමයට ස්තුතිකරව්.

5. මක්නිසාද උන්වහන්සේගේ උදහස ඇසිල්ලකට පමණය. උන්වහන්සේගේ කරුණාව දිවිහිමි කොටය. රාත්‍රියේ හැඬීම පවතින නුමුත්, උදය ප්‍රීතිය පැමිණෙන්නේය.

6. මම වනාහි සැපතෙදී කථාකොට, කිසිකලෙකත් නොසෙල්වන්නෙමියි කීමි.

7. ස්වාමීනි, ඔබගේ කරුණාවෙන් ඔබ මාගේ කන්ද ශක්තිමත්කොට පිහිටෙවුසේක. ඔබ මුහුණ සඟවාගත්සේක. මම කැළඹුණෙමි.

8. ස්වාමීනි, ඔබට හඬගැසීමි. ස්වාමීන්ට කන්නලව්කළෙමි.

9. මා වළට බසින කළ මාගේ ලෙයින් ඇති ප්‍රයෝජනය කිම්ද? ධූලි ඔබට ප්‍රශංසාකරන්නේද? ඔබගේ සත්‍යතාව ප්‍රකාශකරන්නේද?

10. ස්වාමිනි, ඇහුම්කන්දී මට කරුණාකළ මැනව, ස්වාමිනි, ඔබ මාගේ ආධාරකාරයා වුව මැනව.

## ඔබගේ අනාගතය තීරණය කරන්නේ ඔබ ගන්නා තීරණය මතයි.

(පාස්ටර් සැම් සෙල්ව රාජ්ගේ පණිවිඩයකි.)

ලෝකයෙහි ජීවත් වෙන්නාවූ සෑම දෙනාම කැමැති වන්නේ ඔවුන්ගේ ජීවිතවල යහපත් වු දේ දැකීමටයි. එනම්, ඔවුන් බලාපොරොත්තු වන්නාවු ආශිර්වාදය නම් ඔවුන් බලාපොරොත්තු නොවූ ආශිර්වාදයත් ලබා ගැනීමටයි. නමුත් දෙවියන්වහන්සේ එක් එක් පුද්ගලයන් කෙරෙහි ඇති අද්වතීය කැඳවීම අනුව වෙනස් වූ මාර්ග වල ගෙනයති. අපගේ මෙම කැඳවීමෙහි වෙනස්කම් තිබීමට පුළුවනි. අප නියමිත වේලාවේදී ගනු ලබන තීරණයන් අපගේ අනාගතය තීරණය කරයි. මෙම සත්‍යතාවය බොහෝ අපගේ ජීවිත කථාව තුලින් අපට හෙලිදරව් වනු ඇත. අනාගතවක්තෘ එළියා, එලීෂා සහ එලීෂා මෙහෙකරු වු ගෙහාසි යන අයගේ ජීවිත දෙස බලමු. මේ සියලුම දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් එකම කාලයකදී ජීවත් වූ එනම් සමකාලිනයෝ වූහ.

### 1 ප්‍රොපේතවර එළියා


එළියා ක්‍රි.පු. 910-896 චක්වා කාල වකවානුව තුළ ජීවත් වූ පුද්ගලයෙකි. ඔහු ගිලියද්හි සිටි නිෂ්බිය එළියාය. ***(1 රාජාවලිය 17:1)*** ඔහු දෙවියන්වහන්සේගේ ප්‍රෝපෙතවරයෙක් ලෙස කැඳවූ පුද්ගලයෙකු ඔහුගේ පවුල පිළිබඳව හෝ ඔහුගේ උත්පත්තිය ගැන කිසිදු සඳහනක් බයිබලයෙහි සටහන්ව නොමැත.

එළියා යන නමෙහි තේරුම නම්, ''යෙහෝවා මගේ දෙවියන්වහන්සේවයි.'' යන්නයි. එළියාගේ ජීවිතය දෙස බලන විටදී දෙවියන්වහන්සේ විසින් ඔහුව කැඳවනු ලැබීය. ඔහුගේ ජීවිතය අවසානයේදි දෙවියන්වහන්සේ විසින් ඔහුව ස්වර්ගයට ඔසවාගනු ලැබීය. ඔහු මරණය අත් දුටවේ නැත. ඔහුට අවමංගල්‍ය දේව මෙහෙයක් තිබුනේ ද නැත. ඔහු තාපස ඇඳුමක් එනම් සතුන්ගේ හම් වලින් සෑදූ ඇඳුමක් හැඳ ඉණ වටා සම් පටියක් බැඳ සිටියේය.

කාන්තාරයෙහි ජීවත් වූ මෙම පුද්ගලයාව දෙවියන්වහන්සේ දුටුවේය. ඔහු පවිත්‍ර වූ ජීවිතයක් ගත කල නිසා ස්වාමින්වහන්ගේ සැලැස්ම හා කැමැත්ත ඉටු කිරීම පිණිස ඔහුව තෝරාගනු ලැබීය. දෙවියන්වහන්සේගේ තෝරා ගැනීම

3 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



## from your dearly beloved brother...

# කැඳවීමේ ප්‍රතිරාවය

"ස්වාමීන්වහන්සේ දයාවන්තය. අනුකම්පාවෙන් පූර්ණය.උදහස් වීමට ප්‍රමාදය. මහත් කරුණාවෙන් යුක්තය" (ගීතාවලිය145:8)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


CHIEF EDITOR
Angeline Selvakumari Henry, M.A., M.Ed.

MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

ADMINISTRATION
Bro. N. Prakasam, M.A., General Manager

EDITORIAL BOARD
Sis. Jesy Veena Sam
Bro. M. Paulraj, M.A., B.Ed.
Sis. Serena Bevin, M.A., M.Phil., B.Ed.



EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 95661 31858

E.mail ID
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

YOUTUBE CHANNEL
Echo of His Call


**ස්වාමීන්වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**
**අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත්වූ නාමය ඔබට සුභ පැතුම් ගෙනෙමි.**

ඔබගේ ප්‍රේමය නිසාත් අපගේ විවිධාකාර වූ සේවාවන් වලට ඔබ දැක්වූ සහයෝගය නිසාත් අප ඔබට ස්තුතිවන්ත වෙමු.
තවද ඔබගේ දයාගුණය ගැනත් ප්‍රේමණීය ක්‍රියාවන් ගැනත් අප ධෛර්‍යමත් වෙමු. දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක.

නෙහෙමියා බයිබල් විද්‍යාලෙහි සභාපති වූ පාස්ටර් මුත්තුගේ සුවය උදෙසා ඔබ කලාවූ යාච්ඤාවන්ට ස්තුති කරමු.
ඔහුගේ සෞඛ්‍යය තත්ත්වය යහපත් අතරට හැරෙමින් පවති. දිගටම ඔහු ගැන යාච්ඤා කරන මෙන් ඉල්ලමි.

ඔබ දන්නා පරිදි අප ඉ තා කාර්යබහුලව සිටිමු. කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවන් නිකුත් කිරීම, නෙහෙමියා බයිබල් විද්‍යාලෙහි හින්දි, ඔඩිසා හා දෙමළ භාෂාවන්ගේන් පවත්වාගෙන යාමත් ශාන්ත මෙට්‍රිකියුලේෂන් පාසලේ වැඩ කටයුතුත් හා අපගේ සභාවේ සියලු සේවාවන් ආදී සියලුම අංශවල වැඩ කටයුතු බොහොමයක් තිබෙන බැවින් අප ඉතා කාර්යය බහුලව ක්‍රියා කරමු. චෙන්නෙයි නුවර ඇතුලත හා පිටත අපගේ සියලුම ක්‍රියාකාරකම් හා ගමන් වලදි දෙවියන්වහන්සේ අපට ආශිර්වාද කලේය.

අපගේ සහෝදරයෙක් වන කැඳවීමේ ප්‍රතිරාවය සඟරාවේ ප්‍රධාන කර්තෘ වන සහෝදර මැනුවෙල් පෝල් රාජ් මැයි මස 25 වන දිනදී දෙවියන්වහන්සේ තුළ සැතපුණේය. කරුණාකර ඔහුගේ පවුලේ සාමාජිකයන් උදෙසා යාච්ඤා කරන්න. ඔහු රෝගීව සිටි විටදී ඔහු උදෙසා ඔබ යාච්ඤා කල නිසා ඔබට ස්තුති කරමි.

දේව කරුණාවෙන් 23 වන උපාධි පිරිනැමීමේ උත්සවය නෙහෙමියා බයිබල් විද්‍යාලේදී ජූනි මස 3 වන දිනය පවත්වනු ලැබීය. එහිදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් 23 දෙනෙක් උපාධි ලබා විවිධ පළාත් වල සේවය කිරීම සඳහා පිටත්ව ගියෝය.

දේව කරුණාවෙන් ජූනි මස 6 වන දින නැවත නෙහෙමියා බයිබල් විද්‍යාල ආරම්භ කරමු. එමෙන්ම ජූනි මස 13 වන දින ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන්ස් පාසල ආරම්භ කරමු.

කරුණාකාර අපගේ පවුලේ සාමාජිකයින් කැඳවීමේ ප්‍රතිරාවයේ පවුලේ සියලුදෙනා වෙනුවෙන් ඔබගේ යාච්ඤාව නිරන්තරයෙන්ම අපි බලාපොරොත්තු වෙමු.

දෙවියන්වහන්සේගේ රාජ්‍යයෙහි අප කරමින් යන සේවාවන් වලට අපට අවශ්‍ය වන්නාවූ සියලුම අවශ්‍යතා ගැන නොකඩවාම යාච්ඤා කරන්න.
දෙවියන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා...

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**


පාස්ටර් සැම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සැම්
(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✺ BIBLECOR - Postal Courses (3 languages) ✺ Online Courses ✺ Theological Correspondence Courses (2 languages) ✺ Church Planting ✺ Nehemiah Bible Colleges ✺ Gospel Printing Press ✺ Great Commission Partners ✺ St. Paul's Matriculation School ✺ Crusades ✺ Community Development

*1 පිටුවෙන්....*

මනුෂ්‍යයන්ගේ ඇඳුම් වලින්වත්, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් වලින්වත් ඔවුන් සතුව ඇති මුදල් නිසාවත් හෝ ඔවුන්ගෙ පවුල් පසුබිම බලාවත් නොවේය. එලියාට තිබූ එකම සුදුසුකම නම් ඔහු ඕනෑ වෙලාවක දෙවියන්වහන්සේගේ හඬට ඇහුමකන් දීමට සූදානමින් සිටීමය. ඔම්රිගේ පුත්‍ර වූ ආහාබ් ඉශ්‍රායෙල් කෙරෙහි රජ වීය. ආහාබ් තමාට පළමුවෙන් සිටි සෑම දෙනාට වඩා ස්වාමින්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබූ දෙය කළේය. තව ද ඔහු නෙබාත්ගේ පුත්‍ර වූ යෙරොබෝවම්ගේ පාපවල හැසිරුනා මදිවාක් මෙන් ශිදොන්වරුන්ගේ රජ වූ එත්බාල්ගේ දූ වූ යෙසෙබෙල් භාර්‍යාව කොට පාවා ගත්තේය. ඔහු ගොස් බාල්ට සේවය කරමින් නමස්කාර කළේය. තවද ඔහු සමාරියේ ගොඩ නැඟූ බාල්ගේ ගෘහයෙහි බාල්ට පූජාසනයක් සෑදුවේය. *(1 රාජාවලිය 16:30-32)*

## 1. එලියා වර්ෂාව පැමිණෙන්නේ නැත කියා ප්‍රකාශ කල අතර එය එසේම සිදුවිය.

දෙවියන්වහන්සේගෙ වචනය එලියා ආහාබ් රජතුමාට ප්‍රකාශ කළේය. එනම්, ''මා නැවත පවසන තුරු වසර තුනහමාරක කාලයක් වතුර බිංදුවක්වත් වහින්නේ නැත කියා ප්‍රකාශ කළා'' මෙසේ ඔහු ප්‍රකාශ කල ලෙසම වසර තුනහමාරක කාලයක් වර්ෂා ලැබුනේ නැත. දෙවියන්වහන්සේ පැවසූ දේ රජතුමාට ප්‍රකාශ කිරීමට එලියා බය වූයේ නැත.

එලියා ශුද්ධ වූ දේව භක්තිය ඇති ඇදහිල්ලෙන් පූර්ණ වූ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙක්ව සිටියේය. ඔහු නිර්භීතව ඔහුගේ හෘර්ද සාක්ෂියට අනුව ක්‍රියා කරනු ලැබීය.

## 2. ඔහු ඉතා කීකරු අනාගතවක්තෘවරයෙකි.

දෙවියන්වහන්සේ එලියාට කතා කොට ***''මෙතැනින් පිටත්ව පූර්ව දිශාවට ගොස් යොර්දාන් ඉදිරිපිට තිබෙන කෙරීත්නම් ඔය ළඟ සැඟවී සිටපන්න'' (1 රාජාවලිය 17:3)*** කියා පැවසීය. එලියා උණ්වහන්සේගේ වචනයට කීකරු වී එම ස්ථානයට ගියේය. දෙවියන්වහන්සේ කියූ පරිදි උදේ සවස කපුටෝ රොටී සහ මස් රැගෙන ආවෝය. දිගු කාලයක් වර්ෂාව නොමැති නිසා ටික කාලයක් ගිය විටදී එම ඔයෙහි වතුර සිඳී ගියේය. එවිට දෙවියන්වහන්සේ ඔහුට කතා කොට ''නැගිට සාරිෆෙත් යන ස්ථානයට යන්න. එහිදී නුඹව බලා ගැනීමට වැන්දඹු ස්ත්‍රීයකට අණ කළෙමි.''යි කියා පවසනු ලැබීය. එලියා එම අණට කීකරු වී ශාරපෙත්ට ගියේය. එහිදී ඔහුට එම වැන්දඹු ස්ත්‍රිය මුණ ගැසුණි. ඇයගෙන් ඔහු රොටී සහ වතුර ඉල්ලු කල්හි ඇය සතු තිබුණේ පිටි කුඩා ප්‍රමාණයක් පමණි. නමුත් ඇය දෙවියන්වහ්නසේගේ මනුෂ්‍යයා ඇයගෙන් ඉල්ලූ දෙය ඔහුට දුන් නිසා ඇය සම්පූර්ණයෙන්ම ආශිර්වාදය ලබා ගත්තේය. නැවත වර්ෂාව පැමිණෙන තුරුම කෑම හිඟයක් ඔහුට පැමිණුනේ නැත. ඉන් අනතුරුව ඔහුගේ පුත්‍රයා මිය ගිය විටදී එලියා මලවුන්ගෙන් ඔහුව නැගිටුවා ඇයට ආශිර්වාද කරනු ලැබීය.

## 3. එළියා නිර්භීත ප්‍රොපේතවරයෙකි

*''ඔහුද, මා අනුව නුඹ සහ නුඹේ පියාගේ වංශය ස්වාමින්වහන්සේගේ ආඥා අත්හැර බාල් දේවතාවන් පස්සේ ගිය කාරණයෙන් නුඹලා ඉශායෙල් කැළඹූවහුය. ඉතිං දූත් පණිවිඩ යවා සියළු ඉශ්‍රායෙල්වරුන්ද බාල්ගේ ප්‍රොපේතවරුන් හාරසිය පනස ද යෙසබෙල්ගේ මේසයේ කන අශේරිය ප්‍රොපේතවරුන් හාරසිය දෙනා ද මා ළඟට කර්මෙල් කන්දට රැස්කරවන්නැයි කීවේය. එවිට ආහබ් සියළු ඉශ්‍රායෙල් පුත්‍රයින් අතරට පණිවිඩ යවා ප්‍රොපේතවරු කර්මෙල් කන්දට රැ ස් කෙරෙව්වේය. එවිට එළියා මුළු සෙනඟ ළඟට ඇවිත් කතා කොට නුඹලා කොපමණ කල් කල්පනා දෙකක් අතරේ හිරවී සිටිනවා ද? ස්වාමින්වහන්සේ දෙවියන්වහන්සේනම් උන්වහන්සේ අනුව යන්න බාල් දෙවියන්වහන්සේ නම් ඔහු යනුව යන්නැයි කීවේය. නමුත් සෙනඟ ඔහුට කිසිම උත්තරයක් දුන්නේ නැත. එවිට එළියා සෙනඟට කතා කොට ස්වාමින්වහන්සේගේ ප්‍රොපේත කෙනෙක්ව ඉතුරුව ඉන්නේ මම පමණකි. නුමුත් බාල්ගේ ප්‍රොපේතවරු හාරසිය පනස් දෙනෙක් සිටිති. එබැවින් අපට ගොන් දෙන්නෙක් දෙත්වා ඔහු එක ගොනෙක් තෝරාගෙන කැබැලි කර කපා දර පිට තබා යටින් ගිනි නොතබත්වා. මමත් අනිත් ගොනා පිළියෙල කොට දර පිට තබා යටින් ගිනි නොතබන්නෙමි. නුඹලා නුඹලාගේ දෙවියන්ගේ නාමය කියා යාච්ඤා කරන්න. මමත් ස්වාමින්වහන්සේගේ නාමය කියා යාච්ඤා කරන්නෙමි. එවිට ගිනි එවීමෙන් උත්තර දෙන දෙවියන්වහන්සේම දෙවියන්වහන්සේ වන සේක්වයි කීවේය. මුළු සෙනඟ උත්තර දෙමින් ඒ කීම යහපතයි කීවෝය. එළියා බාල්ගේ ප්‍රොපේතවරුන්ට කතා කොට නුඹලා බොහෝ දෙනෙකු බැවින් පළමුකොට නුඹලාට ගොනෙකු තෝරාගෙන පිලියෙල කර නුඹලාගේ දෙවියන්ගේ නාමය කියා යාච්ඤා කරන්න. නුමුත් යටින් ගිනි නොතබන්නැයි කීවේය. ඔහු තමුන්ට ලැබුණු ගොනා රැගෙන පිලියෙල කොට උදේ පටන් ඉර මුදුන් වෙලාව දක්වා බාල්ගේ නාමයෙන් යාච්ඤා කරමින් අහෝ බාල් ඔබ අපට උත්තර දුන මැනැවයි කීවේය. නුමුත් කිසි හඬක්වත් උත්තර දුන් කිසිවෙක්වත් නොවීය. ඔහු සාදා තිබූ පූජාසනය වටේට නට නටා ඇවිද්දෝය. ඉර මුදුන් වෙලාවේ එලියා ඔවුන්ට කවටකම් කොට හයියෙන් මොර ගසන්න. මක්නිසාද ඔහු දෙවි කෙනෙක, ඔහු මෙනෙහි කරමින් හෝ බැහැර ගොසින් හෝ ගමනක් යමින් හෝ ඇත. සමහරවිට*

*4 වෙනි පිටුවට....*

*ඔහු නිදා ගෙන සිටී. ඒ නිසා පුබුදුවන්නට ඕනෑ යයි කීවේය. ඔහු මහත් හඬින් මොර ගසා තමුන්ගේ සිරිතේ හැටියට ලේ ඇගේ වැගිරෙන තුරු පිහියාවලිනුත්, හෙල්ලවලිනුත් තමුන්ගේ ශරීර කපා ගත්තෝය. ඉර මුදුන් වෙලාව පසු වී සවස යාගය ඔප්පු කරන වෙලාව දක්වා ඔහු ධර්ම වාක්‍ය දෙසුවෝය. නුමුත් කිසිම හඬක්වත් උත්තර දුන් කිසිවෙක්වත් සැලකූ කෙනෙක්වත් නොවීය. එවිට එලියා මා ළඟට එන්නැයි මුළු සෙනඟට කීය. මුළු සෙනඟ ඔහු ළඟට ආවෝය. ඔහු වනාහී කඩා දමා තිබූ ස්වාමීන්වහන්සේගේ පූජාසනය හරිගස්සවා නුඹේ නාමය ඊශ්‍රායෙල් වන්නේය. යන ස්වාමීන්වහන්සේගේ වචනය ලැබූ යාකොබ්ගේ පුත්‍රයන්ගේ ගෝත්‍රවල ගණන ලෙස ගල් දොළසක් රැගෙන ස්වාමීන්වහන්සේගේ නාමයෙන් පූජාසනයක් ගොඩ නඟා ඒ පූජාසනය වටේට බිජුවට නැලි දෙකක් අල්ලන තරම් වූ අගලක් කපා දර පිලිවෙලින් තබා ගොනා කැබැලි කොට කපා දර පිට තැබුවේය. තවද වතුර සැලි සතරක් පුරවා දවන යාගය පිටත් දර පිටත් වත්කරන්නැයි ඔහු කීවේය. දෙවන වරත් එසේම කරන්නැයි කීවේය. ඔව්හු දෙවැනි වරත් එසේම කළෝය. තුන්වැනි වරත් එසේම කරන්නැයි ඔහු කීවේය. ඔව්හු තුන්වැනි වරත් එසේ කළෝය. වතුර පූජාසනය වටේට ගලා ගොස් අගලද වතුරෙන් පිරුණේය. තවද සවස යාගය ඔප්පු කරන වෙලාවේ එලියා අනාගතවක්තෘ තෙමේ ළංවී කතාකොට ආබ්‍රහම්ගේ ද ඊසාක්ගේ ද ඊශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමින්වහන්ස ඔබ ඊශ්‍රායෙල්හි දෙවියන්වහන්සේ බවද මා ඔබගේ සේවකයා බවද මා මේ දේ කලේ ඔබගේ වචනය ලෙස බව ද අද දැන ගන්නට ලැබේවා. ස්වාමින්වහන්ස මට උත්තර දුනු මැනව, ස්වාමී වූ ඔබ දෙවියන්වහන්සේ බවත් මේ සෙනඟගේ සිත් නැවත හරවා ගත්තේ ඔබම බවත් මොවුන් දැන ගන්නා පිණිස මට උත්තර දුන මැනැවයි කීවේය. එවිට ස්වාමින්වහන්සේ වෙතින් ගිනි බැස පූජාවත් දරත් ගලුත් දූලිත් දවා අගලේ වතුරත් වියළා දැම්මේය. මුළු සෙනඟ එය දැක මුහුණින් වැටී ස්වාමින්වහන්සේම දෙවියන්වහන්සේය. ස්වාමින්වහන්සේම දෙවියන්වහන්සේයැයි කීවෝය.'' (1 රාජාවලිය 18:18-39)*

මෙවැනි ක්‍රියාවන් මේ කාල වකවානුවන් තුල දෙවියන්වහන්සේගේ ප්‍රොපේතවරුන් යන අපගේ ජීවිතවල අපට දැකගැනීමට නොහැකිය. අද යම්කිසි හාස්කමක් හෝ දෙවියන්වහන්සේ පැවසුවාවූ දෙයක් සිදුවුනේ නම් එවැනි දාසයන්ව මනුෂ්‍යයන් සොයා ගොසින් එම දාසයන්ගේ යාච්ඤාව නිසා හාස්කම් සිදුවූයේයැයි කියා පවසමින් ඔවුන්ව ප්‍රසිද්ධියට පත් කරනු ඇත. එම හාස්කම් වීඩියෝ ගත කර ඒවා මාධ්‍ය ජාල හරහා මහත් ප්‍රසිද්ධියක් ලබාගනී. අද මෙවැනි දෙවියන්වහන්සේගේ සේවාවන් ව්‍යාපාරයන් බවට හරවාගෙන සිටින ප්‍රොපේතවරු බොහොමයක් සිටී. නමුත් යේසුස්වහන්සේ අපට පවසනු ලැබුයේ, ''***...නුඹලා නොමිලයේ ලැබූවහුය, නොමිලයේ දීපල්ලා....*** '' ***(මතෙව් 10:8)***

## 02. ප්‍රොපේතවර වූ එලීෂා

එලීෂා ගවයන් දොළොස්බානක් පස්සේ හාමින් සිටින විට එලියා ඔහු ළඟට ගොස් ඔහුගේ සළුව ඔහු පිට දැමීය. එලීෂාද එලියාගේ අනුගාමිකයෙක් විය. *(1 රාජාවලිය 19:19)*

දෙවියන්වහන්සේ විසින් එලියාව ජීවමාන ලෙස ස්වර්ගයට ඔසවා ගනු ලැබුවාට පසු එලීෂා, යෙහෝරාම්, යේහු හා යෝවාෂ් යන රජවරුන්ගේ කාල වකවානුවන් තුලදී බොහෝ හාස්කම් කලාවූ ප්‍රොපේතවරයෙක් විය.

එලියා යටතේ එලීෂා ලබාගත්තාවූ පුහුණුව ඉතාම අමාරුවූ පුහුණුවක් විය. දේව සේවයේදී ඉතා යහපත් දේව දාසයෙක් යටතේ ඉතා අමාරු කාලයක් තුල ඉතා අමාරු පුහුණුවක් ලබාගන්නාවූ පුද්ගලයා ඉතා අනර්ඝවූ දේව දාසයෙක් වෙනවා ඇත. ඉරුදින දේව මෙහෙයට පමණක් සහභාගී වී සේවය කිරීම පමණක් පුහුණුවය යැයි කියා සිතන්නාවූ අය සේවය තුල සාර්ථක වන්නේ නැත. එලීෂා අවංක දාසයෙක් වූයේ ඔහු එලියා යටතේ ඉතා අමාරු පුහුණුවක් ලැබූ නිසාය.

### 1. එලීෂා තමාව සේවයට කැඳවීව තැනැත්තා සමඟ එකටම සිටියේය.

එලියා සහ එලීෂා ගිල්ගාල්හි සේවය කරමින් සිටින විට එලියා එලීෂාට ක්ෂණිකවම මෙසේ පවසනු ලැබීය. එනම්, 'ඔබ මෙතන නැවතී සිටින්න. දෙවියන්වහන්සේ මාව බෙතෙල්ට ගෙනයනවා' යනුවෙනි. නමුත් එලීෂා ඔහුගේ නායකයාත් සමඟ, සිටිය යුතුය කියා ස්ථිරවම සිටි නිසා ඔහු මෙසේ පවසනු ලැබීය. ''***.....ස්වාමීන්වහන්සේ ජීවමාන බව සැබවා සේම, මම ඔබ අත්නොහරිමි....***'' කියා ඔහු එලියා පසුපසම ගියේය.

පසුව ඔවුන් දෙදෙනා බෙතෙල්ට පැමිණ එතනින් යෙරිකෝව බලා පිටත්විය. මෙම සෑම අවස්ථාවකදීම එලියා එලීෂාව නතරකිරීමට උත්සහ දැරූ නමුත් එලීෂා ඔහුගේ අනාගත නායකයාවූ එලියාව එක් මොහොතකදීවත් අත්හරිනු ලැබුවේ නැත. ඔහුගේ නායකයා ගමන්කලාවූ සෑම ස්ථානයකටම ඔහුත් ගමන් කරනු ලැබීය.

ඔවුන් යොර්දා ළඟට පැමිණි විටදීද, එලියාට අවශ්‍යවූයේ එලීෂාව එහි නතරකර ගඟෙන් එතෙරවීමටය. නමුත් එලීෂාද ඔහුත් සමඟ ගඟෙන් එතෙරට එන බවට ස්ථිරවම සිටි බැවින් ඔහු එලියාත් සමඟ යොර්දාන් ගඟෙන් එගොඩට ගියේය. ගඟෙන් එගොඩට යාමට පෙර එලියා තමාගේ සළුව රැගෙන අකුලා එයින් යොර්දාන් ගඟේ

*6 වෙනි පිටුවට ...*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**ජූලි:19-** රෝගීව සිටින අය ඖෂධ නොමැතිව පීඩාවට පත්වී සිටින වර්තමාන කාලයේ දිව්‍ය සුවය ගැන යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

**ජූලි:20-** (2 ලේකම් 7:14) කියවමින් රට නිදහස් කරගැනීම සඳහා යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

**ජූලි:21-** නොකඩවා පැයකට වැඩි කාලයක් අන්‍ය භාෂාවෙන් යාච්ඤා කරන කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**ජූලි:22**- යාච්ඤා පා ගමනක් යාමට තීරණයක් ගෙන ඇති අය ගැන ස්තුති කරන්න.

**ජූලි:23**- යාච්ඤා මැදහත්කරුවන් වීමට උනන්දුවක් දක්වන අය ගැන ස්තුති කරන්න.

**ජූලි:24**- (බයිබල් අධ්‍යයන ක්‍රම) නිවැරදිව උගන්වන කිතුණු ගුරුවරුන් ගැන ස්තුති කරන්න.

**ජූලි:25**- කිතුණු ආචාර ධර්ම, කිතුණුවන්ට ඉගැන්වීමට උනන්දුවක් දක්වන අය ගැන ස්තුති කරන්න.

**ජූලි:26**- කිතුනුවන්ට දේව භය හා ගෞරවය ගැබෙන පිණිස අය ගැන ස්තුති කරන්න.

**ජූලි:27**- යේසුස්වහන්සේගේ ප්‍රේමයට බද්ධ වූ නවක ඇදහිලිවතුන් ගැන ස්තුති කරන්න.

**ජූලි:28**- මිෂනාරිවරුන්ගේ අවංක සේවය කරුණු කොට ගෙන අප දේශයට ලැබුණු ක්‍රිස්තුස්වහන්සේගේ ආශිර්වාද ගැන ස්තුති කරන්න.

**ජූලි:9**- ආත්මයාණන්වහන්සේ තුල නිතරම ප්‍රීතියෙන් සිටින කිතුණුවන් ගැන ස්තුති කරන්න.

**ජූලි:30**- ඔහුගේ (යේසුස්වහන්සේගේ) ඇමතුමේ දෝංකාරය පුවත්පත සේවය ගැන ස්තුති කරන්න

**ජූලි:31**- ඔහුගේ (යේසුස්වහන්සේගේ) ඇමතුමේ දෝංකාරය පුවත් පත් සේවයේ නිර්මාර්තෘ සැම් සෙල්වරාජ් දේවගැතිතුමා සහ ඔහුගේ පවුලේ අයට ලැබුණු නිරෝගි සුවය ගැන ස්තුති කරන්න.

**2022 අගෝස්තු මාසය**

**අගෝ:01-** දේවදාසයන් මත වගුරුවන යේසුස්වහන්සේගේ ආලේපය ගැන ස්තුති කරන්න.

**අගෝ:02-** පීඩාවේදී ක්ලාන්ත නොවී සිටීමට කිතුණුවන්ට බලය ලැබෙන පිණිස යාච්ඤා කරන අය ගැන ස්තුති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අගෝ:03-** දවස්පතා ගැලවීම ලබා ගන්නා අය ගැන ස්තුති කරන්න.

**අගෝ:04-** දේව වචනය මෙනෙහි කරමින් ඒවා තම ජීවිතයට අදාල කර ගැනීමට කැමති අය ගැන යාච්ඤා කරන්න.

**අගෝ:05-** දෙවියන්වහන්සේගේ මුහුණ සොයමින් නපුරු මාර්ග වලින් හැරීමට කැමති අය ගැන යාච්ඤා කරන්න.

**අගෝ:06-** බේබදුකමෙන් නිදහස් වී සිටින කිතුනුවන් බේබදුකමට අසුවී විනාශවන අය ගැන ආත්ම බරක් ඇතිව යාච්ඤා කරන්න.

**අගෝ:07-** දේව සේවකයන් මුහුණ දෙන ගැටළු හඳුනාගෙන ශුද්ධාත්මයාණන්වහන්සේගේ මග පෙන්වීම තුළින් යාච්ඤා කරන්න.

**අගෝ:08-** දෙවියන්වහන්සේගේ රාජ්‍ය පැතිරීම පිණිස උනන්දුවකින් යාච්ඤා කරන්න.

**අගෝ:09-** වැන්දඹු ස්ත්‍රීන් සහ පියා අහිමි ඇති දරුවන් ගැන යාච්ඤා කරන්න.

**අගෝ:10-** රට මුහුණ දෙන දේශපාලන අස්ථාවරය ගැන මැදහත් කරුවන් ලෙස යාච්ඤා කරන්න.

**අගෝ:1-** බෝනොවන රෝග වලින් පීඩා විඳින අය ගැන යාච්ඤා කරන්න.

**අගෝ:2-** රැකියා විරහිත සියලු දෙනාටම සුදුසු රැකියාවක් ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:13-** මේ වසරේදී බයිබල් විද්‍යාවලට ඇතුල්වී සිටින සිසු සිසුවියන් ගැන යාච්ඤා කරන්න.

**අගෝ:14-** කිතුණුවන්ට ශාරීරික හෝ මානසික පීඩාකරන්නන් එයින් ඉවත්වන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:15-** නැවුම් ශුද්ධාත්ම ආලේපයක් සෑම දේව සේවයෙකුටම ලැබෙන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:16-** සෑම කිතුණු නිකායකම ව්‍යාජ ධර්ම පතුරුවන්නන් හඳුනාගැනීමට හැකිවන පිණිස යාච්ඤා කරන්න.

**අගෝ:17-** අපට පුද්ගලිකව වැරදි කළ අයට සමාව දී යාච්ඤා කරන්න.

**අගෝ:18-** ක්‍රිස්තුස් වහන්සේගේ දෙවෙනි ඊමට සෑම කිතුණුවෙක්ම සූදානම්ව සිටින පිණිස යාච්ඤා කරන්න.

*4 පිටුවෙන්....*

වතුරට ගැසීය. එවිට යොර්දාන් ගඟ දෙබෑවූ අතර ඔවුන් දෙදෙනා ඒ මැදින් ඇවිද එතෙරට යනු ලැබීය.

දැන් එලියා එලීෂාට මෙසේ පවසනු ලැබීය. ''මා දැන් මේ ලෝකය අතහැර දමා යමි. ඊට පෙර ඔබට මගෙන් ඕනෑ දෙයක් ඉල්ලාපන්න,'' කියා පැවසීය. එවිට එලීෂා ''ඔබට තිබෙන ආත්මයෙන් දෙගුණයක් මා කෙරෙහි පැමිණේවා'' කියා පැවසීය. එවිට එලියා ''නුඹ අමාරු දෙයක් ඉල්ලුවෙහිය. එහෙත් නුඹ වෙතින් මා ගන්න විට නුඹ මා දුටුවොත් නුඹට එසේ වන්නේය. නැතහොත් එසේ නොවන්නේය.'' කියා පවසනු ලැබීය. එලීෂා ඉතා උවමනාවෙන් එලියා දෙස බලා සිටිනු ලැබිය. එවිට ඔවුන් කතා කර කර යද්දී ගිණි රථයක් ද ගිණි අශ්වෝයද පෙනී ඔවුන් දෙදෙනා වෙන් කළෝය. එලියා සුළි සුළඟකින් ස්වර්ගයට නැගී ගියේය. *(2 රාජාවලිය 2:12-13)*

## 2. එලීෂා කිසිවිටක අධෛර්යට පත් වූයේ නැත.

තමාගේ නායකයා විසින් කීප වතාවක්ම එලීෂාව සෝදිසි කරනු ලැබූවත් ඔහු කිසි විටෙක අධෛර්යට පත් වූයේ නැත.

දෙවියන්වහන්සේ උදෙසා දුක් විඳින්නාවූ අයව උන්වහන්සේ අධෛර්යට පත් නොකරයි. ලැජ්ජාවට පත් නොකරයි. ඔබගේ ජීවිතයෙහි සමහර කාරණාවන් ඉෂ්ඨ නොවන්නේය කියාත් නැතිනම් ඔබගේ යාච්ඤාවන්ට පිළිතුරු ලැබෙන්නේ නැත කියාත් ඔබගේ මුදල් කිසිම ඵලක් නොමැති දේ වලට වියදම් කර ඇති බවත් ඔබ දෙවියන්වහන්සේට සේවය කරනු ලැබුවත් බොහෝ අවස්ථාවන් වලදී ඔබ පරාජියට පත්ව ඇත කියාත් ඔබ සමහරවිට හිතනවා විය හැක. ''මේ සියල්ලම කරන්නේ දෙවියන්වහන්සේ ද?'' කියා ඔබ තුල යම් ප්‍රශ්නාර්ථයක් ගොඩ නැගී තිබෙනවා ඇත.

ඔබ අධෛර්‍යට පත් වී සිටී ද නමුත් ඔබගේ හදවත එහි තිබෙන්නාවූ බලාපොරොත්තු නැති කර නොගන්න. දෙවියන්වහන්සේ ඔබගේ ජීවිතයේ හාස්කමක් කරනු ඇත. ඔබගේ ජීවිතය එලීෂාගේ ජීවිතය මෙන් වෙනස් කරයි කාලය මේ වෙනස ගෙන එයි. ඔබට එම ඉඩ ප්‍රශ්ථාව සලසා දෙයි. නුමුත් ස්වාමින්වහන්සේ වෙනස් වන්නේ නැත.

දෙවියන්වහන්සේ එලියාව ඔසවා ගත් විට ''මාගේ ස්වාමිනී, මාගේ පියාණනී'' කියා එලීෂා මොර ගැසුවත් ඔහු ඔහුගේ ඇඳහිල්ල නැති කරගත්තේවත් ඔහුගේ බලාපොරොත්තුව නැති කරගත්තේවත් නැත. ඔහු ඔහුගේ කැඳවීමේ ආලේපය ද නැති කරගත්තේ ද නැත ඔහු ස්වර්ගය දෙස බලා හඬ ගැසීය.

ප්‍රිය සහෝදර සහෝදරිය එලීෂා එලියාගෙන් වැටුණු සළුව රැගෙන යොර්දාන් ගඟට ගැසීය. එය දෙබෑ විය. එලිෂා ගඟේ එගොඩට ගියේය. ඔබ කුමන ආකාරව සිටියත් දෙවියන්වහන්සේට ඔබව පාවිච්චි කිරීමට පුළුවන. එලීෂා එලියා කළාක් මෙන් හාස්කම් දෙගුණයක් කළේය.

## 3. දෙවියන්වහන්සේ සෑම කුඩා යාච්ඤාවකටම පිලිතුරු දෙන සේක.

අප අපගේ අවශ්‍යතා උදෙසා දෙවියන්වහන්සේට යාච්ඤා කරන කල්හි අප කැමැති ආකාරයට යාච්ඤාවට පිලිතුරු දීමට අවශ්‍යය කියා උන්වහන්සේට කිසිදු අවශ්‍යතාවයක් නැත. උදාහරණයක් ලෙස ඔබ බැංකුවෙන් ණය මුදලක් (Bank Loan) ලබාගැනීම පිණිස නිරාහාරව සිටිමින් යාච්ඤා කරනවා ඇත. නමුත් එය ලබා ගැනීමට දෙවියනවහන්සේ උපකාර නොකරනවා ඇත. නමුත් පුදුමාකාර ලෙස දෙවියන්වහන්සේ ඔබගේ හම අවශ්‍යතාවය වෙනත් මාර්ගයක් තුලින් සපයනවා ඇත.

ඩොක්ටර් රබීන්ඩ්ර් බෝඅස් කියා මගේ ඉතා හොඳ මිත්‍රයෙක් සිටියේය. ඔහු ශෛල වෛද්‍යාවරයෙක් වූ අතර ඔහු මුදල් වලට තණ්හාවක් නොමැති දේව භය ඇති පුද්ගලයෙකි. දිනක් තවත් මගේ මිත්‍රයෙක් මා වෙතට පැමිණ ඔහු අර්ශස් අමාරු තත්ත්වයකින් පෙලෙන බවත් ඒ සඳහා ඔහුට ශෛලය කර්මයක් කිරීමට අවශ්‍ය බවත් පවසා ඒ උදෙසා ඔහුට යාච්ඤා කරන මෙන් මගෙන් ඉල්ලා සිටියේය. මා ඔහුට යාච්ඤා කර පසුම මා ඔහුව මගේ මිත්‍ර වෛද්‍යවරයා වෙතට ඔහුව ගෙන ගියෙමි.

මගේ රෝගී වූ මිත්‍රයාව පරීක්ෂා කිරීමට පෙර මා මිත්‍ර වෛද්‍යවරයා ඔහුට කුඩා යාච්ඤාවක් කිරීමෙන් අනතුරුව ඔබට ශෛල්‍ය කර්මයක් කිරීමට අවශ්‍ය නැත ඔබ හැකි තරම් ජලය පානය කරන්න. පලා වර්ග ආහාරයට වැඩි පුර එකතු කර ගන්න හා කෙසෙල් වර්ග ආහාරයට ගන්න කියා පවසා ඇත. තව සතියකින් පසු එන්න මා විශ්වාස කරනවා දෙවියන්වහන්සේ ඔබව සුව කර ඇතැයි කියා ඔහු ප්‍රකාශ කරනු ලැබීය. නැවත අප ආපසු එන විටදී මගේ රෝගී මිත්‍රයාගේ මුහුණෙහි කිසිම සතුටක් නොතිබුණි. ''ඔබ දුකින් සිටින්නේ ඇයි?'' කියා මා ඔහුගෙන් ඇසූ විට ඔහු පවසනු ලැබුයේ, ''මා ශෛල්‍ය කර්මයක් බලාපොරොත්තු වුනා නමුත් ඒ ගැන ඔහු මට කිසි දෙයක් කලේ නැත'' කියා නමුත් ඔහු වෛද්‍යවරයා කියූ දේ විශ්වාස කරනු ලැබීය.

පුදුම වූ හාසකමක් සිදු විය. සතියක් තුලදී කිසිදු ශෛල්‍ය කර්මයකින් තොරව ඔහු සම්පූර්ණයෙන්ම සුවය ලැබීය. මෙම රෝගියා ශෛල්‍ය කර්මයක් බලාපොරොත්තු වුවත් එය සිදු නොවූ නමුත් ඔහුට සුවය ලැබුණි.

බොහෝ අවස්ථාවන් වලදී අපගේ මනස සිතන පරිදි අපගේ යාච්ඤාවට පිලිතුරක් බලාපොරොත්තු වුවත් උන්වහන්සේ තම ප්‍රඥාවෙන් හා බලයෙන් උන්වහන්සේ කැමති ප්‍රකාරව ක්‍රියා කරති. ඒ නිසා අප උන්වහන්සේ කැමැති වන ආකාරයට අප සූදානම් විය යුතුය.

එලීෂා එලියාගේ ආත්මික දීමනා දෙගුණයක් බලාපොරොත්තු වුවත් ඔහුට ලැබුනේ එලියාගේ සළුව පමණි. නමුත් එලීෂා මුළු හදවතින්ම එම සළුව බාරගත්තේය.

ප්‍රිය දෙවියන්වහන්සේගේ දරුවෙනි, ඔබගේ යාච්ඤාවට දෙවියන්වහන්සේ පිලිතුරු දෙන ආකාරය ගැන ඔබගේ ප්‍රතිචාරය කුමක් ද?

## 3. ගෙහාසි

සිරියානු හමුදාවේ නාමන් නැමැති සෙන්පතියෙක් සිටි අතර ඔහුට කුෂ්ඨ රෝගයක් වැලදී තිබුණි. **(2 රාජාවලිය 5:1)** ඔහුගේ නිවසෙහි මෙහෙකාර කම සඳහා ඉශ්‍රායෙල් දේශයෙන් එක් කුඩා ගැහැණු ළමයෙක්ව ගෙනවිත් තිබුණේය. මෙම කුඩා ගැහැණු ළමයා ඇගේ ස්වාමිදූට මෙසේ පවසනු ලැබීය. ''මාගේ ස්වාමියා සමාරියේ අනාගතවක්තෘ ඉදිරියෙහි පෙනී සිටියහොත් හොඳය. එවිට ඔහු ඔහුගේ කුෂ්ඨය සුවකරනවා ඇතැයි'' කීවේය. මෙසේ නාමාන් එලීෂා ළඟට ආවාය. එවිට එලීෂා ඔහුට යොර්දාන් ගඟෙන් සත්වරක් නාන්නය කියාත් එවිට නුඹේ මාංශය හරී ගැහී පවිත්‍රවන්නේය. කියා පණිවිඩකාරයෙකු අත කියා ඇරියේය. එය ඇසූ නාමන් කෝපයට පත් වී මෙසේ පැවසුවේය. ''ඔහු පිටතට මා ළඟට ඇවිත් සිටගෙන තමාගේ දෙවිවූ ස්වාමින්වහන්සේගේ නාමය කියා යාච්ඤා කර, කුෂ්ඨය මත්තෙහි තමාගේ අත වනා රෝගියා සුව කරනවා ඇතැයි සිතුවෙමි. මගේ රටේ ස්නානය කිරීම යොර්දානට වඩා හොඳ ගංගාවන් තිබෙනවා නොවෙද?'' යනුවෙනි. නමුත් ඔහුගේ සේවකයා පැවසුවේ, ''මාගේ පියාණනි, අනාගතවක්තෘ මහත් දෙයක් කරන්ට ඔබට කීවේ නැත්නම් ඔබ කරන්නේ නැද්ද? එසේවී නම් නාලා පවිත්‍රවන්නැයි ඔහු ඔබට කී කල ඒක කරන්ට බැරිදැයි'' කීවෝය.

නාමන් ද ඔහුගේ කීමට සවන් දී යොර්දාන් ගඟෙහි සත් වරක් ගිලුනි. දෙවියන්වහ්නසේගේ වචනයට අනුව ඔහුගේ මාංෂය කුඩා දරුවෙකුගේ මාංශය මෙන් වී ඔහු පවිත්‍ර විය ඔහු ක්ෂණිකවම දෙවියන්වහ්නසේගේ මනුෂ්‍යයා වෙතට පැමිණ මෙසේ පවසනු ලැබීය. ***''එවිට ඔහු තමාගේ මුළු පිරිවර සමග දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයා ළඟට හැරී ඇවිත් ඔහු ඉදියෙහි සිට කථා කොට ඉතින් ඉශ්‍රායෙල්හි සිටින දෙවියන්වහන්සේ මිස මුළු පොළොවේ වෙන දෙවි කෙනෙක් නැත් බව දූන් දනිමි. එබැවින් දූන් ඔබගේ මෙහෙකරුවාගෙන් සතුටු පඬුරක් පිළිගත මැනවයි කීවේය. ඔහුද, මා සේවය ස්වාමින්වහන්සේ ජීවමාන බව සැබෑවාසේම මම කිසිවක් පිළිනොගනිමියි. කීවේය. එවිට ඔහු එය පිළිගන්න හැටියට ඔහුට පෙරැත්ත කළේය. එහෙත් ඔහු නොකැමති විය.'' (2 රාජාවලිය 5:11-16)***

එලීෂාගේ මෙහෙකාර වු ගෙහාසි මේ සියලු දේ ගැන බලා සිට තමාට මෙසේ පවසා ගනු ලැබීය. ''මාගේ ස්වාමියා මේ සිරියේ නාමන් ගෙනා දේ පිළිනොගෙන නිකම් ඇරියේය. මම ඔහු පස්සෙන් යමි කියා එය පසු පස ගියේය. තමා පස්සෙන් යමෙක් දුව දුටු නාමන් ඔහු සම්බවීමට රථයෙන් බැස ''සියල්ල හොඳදැයි'' ඇසීය. ගෙහාසිද ''සියල්ල හොඳය'' කියා පැවසීය. ''මාගේ ස්වාමියා ශිෂ්‍ය ප්‍රොපේතවරුන්ගෙන් තරුණයෝ දෙදෙනෙක් ඒප්‍රායිම් කඳු රටේ සිට මේ දූන් මාවෙතට ආවෝය. ඔවුන්ට රිදී තලෙන්තයකුත් ඇඳුම් කුට්ටම් දෙකකුත් දුන මැනවැයි කීමට මා එව්වේය.'' එවිට නාමන් ''නුඹ තලෙන්ත දෙකක් සතුටු වෙන්නැයි කියා ඔහු පෙරැත්ත කර රිදී තලෙන්ත දෙකක් මලු දෙකක බැඳ, ඇඳුම් කුට්ටම් දෙකකුත් සමග තමාගේ වැඩකාරයන් දෙදෙනෙකු පිට තැබුවේය. ඔවුහු ඔහුට පෙරටුවෙන් ඒවා උසුලාගෙන ගියෝය. හෙළ ළඟට පැමිණි විට ඔහු ඔවුන් අතින් ඒවා රැගෙන ගෙයි තබා ඒ මනුෂ්‍යයන් යන්ට හැරියේට.

ඔවුන් ගිය පසු ගෙහාසි ඇතුල් වී තමාගේ ස්වාමියා ඉදිරියෙහි සිටියේය. එලීෂා කතාකොට කතාකොට ''ගෙහාසි නුඹ කොහේ ගිහින් ආවාදැයි'' ඔහුගෙන් ඇසීය. එවිට ගෙහාසි, ''ඔබගේ මෙහෙකරුවා කොහේවත් ගියේ නැතැයි' කියා ඔහුට පැවසීය. එලීෂා තමාගේ සේවකයා

9 වෙනි පිටුවට ...

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

### "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## පැන්සල් පැදුර ගැන පැරණි කථාවක්

**"දරුවෙකු සුදුසු මාර්ගයෙහි පුහුණු කරපන්න. එවිට ඔහු වයස්ගතවූ කලත් එයින් අහක්ව නොයන්නේය." (හිතෝපදේශ 22:6)**

රජයේ පාසලක 5 වන ශ්‍රේණියේ ඉගෙනිම හමාරකල මා වැඩිදුර අධ්‍යාපන කටයුතු කිරීම පිණිස උසස් පාසලකට ඇතුළත් වූවෙමි. එහිදී මා පළමු වතාවට ඉංග්‍රීසි හෝඩිය ඉගෙන ගනු ලැබීය. මා එම පාසලට ඇතුළත් වූ පළමු දිනයේදීම පංතියට පැමිණි පංතිභාර ගුරුතුමිය හෙට දවසේදී පාසලට පැමිණෙන විටදී පැන්සලක් හා සටහන් පොතක් රැගෙන එන්නය කියා පවසනු ලැබීය. මා නැවත නිවසට පැමිණි පසු මගේ මවට මේ අවශ්‍යතාවය ගැන පැවසුවෙමි. මගේ පියා පිට පළාතකට ගොස් සිටි නිසා ඇයට සටහන් පොතක් ගැනීමට හැකියාවක් තිබූ නමුත් ඇයට පැන්සලක් ගැනීමට හැකියාවක් නොතිබුණි. මේ අවශ්‍යතාවයන් නිසා ඇගේ නිවසට ආසන්නව සිටි ඥාතීන්ගෙන් මෙය ඉල්ලා ගැනීමට ද අකමැති විය. ඇය මට කථා කරමින් ''ස්වාමි වු යේසුස්වහන්සේට යාච්ඤා කරන්න. උන්වහන්සේ ඔබට පැන්සලක් ලබාදෙයි.'' කියා පවසන ලදී.

මා ඇගේ වචනයට කීකරු වී දණගසා ස්වාමින්වහන්සේට යාච්ඤා කර නිදා ගැනීමට ගියෙමි. පසුදින උදෑසන වන තුරු මට දෙවියන්වහන්සේ පැන්සල් දුන්නේ නැත. ඒ නිසා මා පැන්සලක් නොමැතිව පාසලට ගියෙමි. අනෙකුත් ළමුන් සියලුදෙනාම ඔවුන්ගේ පාවිච්චියට අවශ්‍ය පැන්සලක් ගෙන ආ අතර මා පමණක් ගුරුවරිය පැවසූ ලෙස පැන්සලක් නොමැතිව පාසලට ගියෙමි. එම නිසා ගුරුතුමිය මා ගැන සතුටට පත්වූයේ නැත. ඊළඟ දවසේදී පැන්සලක් නොමැතිව පන්තියට එන්න එපා කියා මා හට පවසනු ලැබීය.

නැවත මා නිවසට පැමිණි පසු ඒ ගැන මගේ මවට පැවසුවෙමි. ඔබ දිගටම යෙස්සුවහන්සේට යාච්ඤා කරන්නය කියා මා හට පවසනු ලැබීය. මා එලෙස කල නමුත් කිසි දෙයක් සිදු වූයේ නැත. නැවතත් මා හිස් අතින් පාසල වෙත ගියෙමි. එදින ද පැන්සලක් රැගෙන ආවදැයි කියා ගුරුතුමිය මගෙන් ඇසීය. එයට පිලිතුරු ලෙස මා ඇයට කීවේ, මගේ මව කීවා යේසුස්වහන්සේට යාච්ඤා කරන්න කියාය. එවිට ගුරුවරියට මා ගැන හා මාගේ මව ගැන මහත් කේන්තියක් ඇතිව ඊළඟ දිනදී පැන්සලක් නොමැතිව පාසලට එන්න එපා කියා පවසනු ලැබීය. මා ඉතාම දුකින් මගේ මවට මේ පණිවිඩය පැවසීය. මගේ පැන්සල් යාච්ඤාවට පිළිතුරු දුන්නේය. කියා යේසුස්වහන්සේට ස්තුති කරන්න කියා ඇය නැවත පවසනු ලැබීය. එම රාත්‍රියේ මට නින්ද ගියේ නැත. මන්ද පසුදින මා පාසලට ගියවිට මට දඬුවම් ලැබේය කියා සිතුවෙමි.

එදින රාත්‍රියේ යම්කිසි කෙනෙක් දොරට තට්ටු කරන හඬක් මට ඇසුනි. සමහරවිට හොරෙක් වෙන්න ඇති ඒ නිසා ඇඳ යටට ගොස් නිදා ගන්නය කියා මගේ මව මට පවසනු ලැබීය.

නමුත් එලෙස දොරට තට්ටුකල පුද්ගලයා මගේ මවගේ නම කියා ජනේලය ළඟට පැමිණ කථා කරනු ලැබීය. ඒ සෙල්වමනි නමැති මගේ මාමා කෙනෙකි ඔහු පාලයන් කෝට්ටේ පොලිස් ස්ථානයෙහි සේවයෙහි යෙදී සිටි කෙනෙකි. එය පිහිටා තිබුනේ අපගේ නිවසේ සිට කිලෝ මීටර් 70ක් පමණ දුරින්ය. අප ඉතා සතුටින් දොර ඇරියෙමු. ඔහු මට බිස්කට්, රස කැවිලි, ඇඳුම් ආදී බොහෝ තෑගි ගෙනවිත් තිබුණි. ඔහු මට දුන් තෑගි මා ඇර බැලූ විට එහි කුඩා පෙට්ටියක් ද තිබෙන බව දුටුවෙමි. මා එම පෙට්ටිය ඇරිය විටදී එම පෙට්ටිය පිරෙන්නම පැන්සල් තිබුණි. (එම කාලයේ තිබූ ඉතා මිල අධික නඩරාජා පැන්සල්) එහි පැන්සල් 24ක් තිබුණි.

මා එම රාත්‍රියේ උඩ පනිමින් කෑගසා යේසුස්වහන්සේට මගේ යාච්ඤාවට පිලිතුරක් දුන්නේය කියා පැවසුවෙමි.

පසුදින මා පැන්සල් 24 තිබු පෙට්ටිය ද සමග ඉතා සතුටින් පාසලට ගියෙමි. අනෙක් සියලුම ශිෂ්‍යයින් පැන්සල් 1ක් තිබූ අතර මා හට පැන්සල් 24ක්ම තිබුණි. එදිනද ගුරුතුමිය මා වෙතට පැමිණ නපුරු විදිහට බලා මගෙන් ප්‍රශ්න කලේය. පැන්සල් මග එනවා කියා මා ඊයේ පැවසුවා අද මගේ අතට එය ලැබුණා කියා මා පැවසුවෙමි.

9 වෙනි පිටුවට

ඇය මගේ පිටට තට්ටු කරමින් යේසුස්වහන්සේ මෙයාට මේ පැන්සල් ලබා දුන්නා කියා අනෙක් ළමයින්ට පැවසුවේය.

ප්‍රිය මිත්‍රවරුනි, මෙට සිදු වූයේ මට වයස අවුරුද් 7ක්ව තිබියදීය. නමුත් ඒ අත්දැකීම මට තවමත් නැවුම්ව පවතී. ***''යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයටත් ඒකාකාරමය'' (හෙබ්‍රෙව් 13:8)*** අදටත් මා මගේ කාමරයේ කුඩා පැදුරක් තබා තිබේ. මා එහි දණගසා යාච්ඤා කරමි. මට තිබූ සියලු වැඩ කටයුතු මධ්‍යයේ දිනකට තුන් වතාවක් මා පැදුරේ දණ ගසා යාච්ඤා කරමි. මා එම පැදුරට ''පැන්සල් පැදුර'' ය කියා පවසමි. මන්ද මීට වසර ගණනාවකට පෙර මා මෙවැනි පැදුරක් දමා ඒ මත හිඳ යාච්ඤා කළෙමි. බයිබලය තමාගේ දෑත් වලින් ඔසවා තමාගේ පාද වලින් දණගසා යාච්ඤා කරන්නාවූ කෙනෙක්ව කවදාවත් පරාජයට පත්වෙන්නේ නැත.

මගේ අවුරුදු 53 ක සේවා කාලය තුළදී මා කවදාවත් කොතැනකවත් ගොස් මුදල් ඉල්ලමින් මුදල් සෙවීම සඳහා උපක්‍රම සෙව්වේ නැත. මට යමක් ලැබුණා නම් එය ලැබුනේ ස්වාමීන්වහන්සේගේ කරුණාව නිසාය. ඒ දේ ලැබෙන්නේ පැන්සල් පැදුරේ දණගසා මගේ අවශ්‍යතා උදෙසා යාච්ඤා කරන විටදීය.

***''මා බලවත්කරන්නාවූ තැනැන්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන'' (පිලිප්පි 4:13)***

*************

***7 පිටුවෙන්....***

කළ දෙය ඔහුගේ දිව්‍යමය ප්‍රඥාවෙන් දැනගත්තේය. ඔහු ඉතා වේදනාවෙන් ගෙහාසිට කතා කොට මෙසේ පැවසුවේය. ***''ඒ මනුෂ්‍යයා තමාගේ රථයෙන් බැස නුඹ සම්බවෙන්ට හැරී ආ විට මාගේ ආත්මය නුඹ සමඟ ගියේ නැද්ද? මේක මුදල් පිළිගන්ටත් ඇඳුම්ද ඔලීවවතුද මිදිවතුද බැටළුවන්ද ගවයන්ද දාස දාසීන්ද පිළිගන්ටවත් වේලාවක්ද? එබැවින් නාමන්ගේ කුෂ්ඨය නුඹටත් නුඹේ වංශයටත් නිරතුරුවම ඇලෙන්නේයයි ඔහුට කීවේය. එවිට ඔහු හිම මෙන් කුෂ්ඨය ඇතුව ඔහු වෙතින් පිටතට ගියේය'' (2 රාජාවලිය 5:20-27)*** ගෙහාසි නම් දේව දාසයාගේ නම දේව දාසයින්ගේ නාම ලේඛනයෙන් ඉවත් කරනු ලැබීය. එම ශාපය ඔහුගේ මුළු පරම්පරාවටම ගියේය.

ඔබ අනුගමනය කරන්නේ කාවද? කියා ඔබ මගෙන් අසනවා නම්, 'මා එලීෂා මෙන් වීමට ආසයි කියා පවසමි. මන්ද එලීෂාගේ ආලේපයත් දෙවියන්වහන්සේ කෙරෙහි තිබූ කැපවීමත් ඉතා මහත්ය. එවැනි දෙගුණයක් ආලේපය ලබා මේ ලෝකය තුළ ජයග්‍රාහී ජීවිතයක් ගත කළ යුතුයි.

ඔබ එලීෂා මෙන් කැඳවීම ලබා තිබෙනවාද? කියා ඔබ මොහොතක් සිතන්නේ නම් මා කැමැත්තෙමි. ඔබ එවැනි කැඳවීමක් ලබාගත් මුත් තවමත් ඔබගේ ජීවිතයේ ශාරීරික හා ආත්මික සටනක් ඇතිව සිටිනවාද? නැතිනම් ඔබ ගෙහාසි මෙන් මුදල් එකතු කරමින් මුදල් පස්සේ යමින් ඔබගේ වටිනා සේවය නැතිකර ගන්නවාද?

අද බොහෝ දේව දාසයින්ගේ ඔලුවල බයිබලය වෙනුවට තිබෙන්නෙ මුදල් එකතු කරන්නාවූ පත්‍රිකා. ඔවුන් කරන්නා වූ වැඩසටහන් වලට ආධාර ලබා ගන්නාවූ ඉල්ලීම්ය. අද බොහෝ දෙනා මුදල් උපයා ගන්නේ කුමන තැන්වලින්ද කියා සොයමින් මුදල් පසුපස ලුහුබැඳ යන්නා වූ ආකාරයක් අපට දැක ගැනීමට හැකිය.

අද දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන්ට මුදල් අවශ්‍ය වූ විට ඔවුන් පවසන්නේ, ඔබගේ මුදල් අපට දෙන්න. අප ඔබගේ ප්‍රශ්න ගැන කඳුළු සමඟ යාච්ඤා කරමු. ඔබ අපට උදව් කරනවා නම්, සැමවිටම ඔබ ආශිර්වාද ලබයි. අපගේ සේවය උදෙසා ඔබ මාස්පතා රුපියල් 1000 ක් පුද්ගලයින් 750 දෙනෙකු දෙනවා නම්, එය මහත් වූ ආශිර්වාදයකි. එසේ නැතිනම් දෙවියන්වහන්සේ අපට කථාකර මෙසේ කීවාය කියා පවසති. එනම්, ''ඔබ ළඟ ඇති විශාල මුදලින් කොටසක් අපගේ සේවයට දෙන්න'' ය කියාය. අද බොහෝ දෙනා මෙවැනි විශාල ක්‍රම වලින් මුදල් ඉපයීමයි.

නමුත් දෙවියන්වහන්සේ මෙවැනි දෙයක් අපට ඉගැන්වූයේ නැත. උන්වහන්සේගේ ගෝලයන්ට පවා උන්වහන්සේ උගන්වනු ලැබුයේ බදු ගෙවන ලෙසය. ***''.... නුඹ මුහුදට ගොස් බිලියක් බා, පළමුකොට අසුවන මත්ස්‍යයා ගනින්න. උගේ කට හැරිය කළ ෂෙකෙලයක් සම්බවන්නේය. ඒක ගෙන මා සහ නුඹ උදෙසා ඔවුන්ට දීපන්නැයි කීසේක'' (මතෙව්***

**Echo of His Call salutes a remarkable man for his extra-ordinary contribution in publications!**



We regretfully announce that

**Bro. Manuel M. Paulraj**

**Senior Associate Editor**

of **Echo of His Call,** English monthly newspaper who was ministering with us for the past about 43 years, aged 72 years had entered into glory on the **25th May, 2022, Wednesday at 6.00 a.m**. He is survived by his wife, son, daughter-in-law, daughter, son-in-law and grand children. Kindly pray for them. We also thank all our brothers and sisters who prayed for his recovery during his illness.

**- Pr. S. Sam Selva Raj**

RNI NO. TN/SIH/2006/17846

*17:27)* අද සමහර අය දේව සේවය කියා වැරදි ලෙස උපයන මුදල් පවා දේව සේවයට අවශ්‍ය නොමැත.

දේව සේවයෙහි යෙදෙන අයට මා යම් උපදෙසක් දීමට කැමැත්තෙමි. ඔබගේ මුදල් ගණුදෙනු පවිත්‍රව තබා ගන්න. අපගේ සේවය අපි හරියාකාරව කරනවා නම්, අපගේ අවශ්‍යතා ගැන අප කණස්සල්ලට පත්වීම අවශ්‍ය නැත. අපගේ අවශ්‍යතා සපුරා ගැනීමට ක්‍රම සහ විධි පාවිච්චි කර මුදල් සෙවීමට අවශ්‍ය නැත. මන්ද අපව කැඳවූ තැනැන්වහන්සේ විශ්වාසනවන්තව සිටින සේක. උන්වහන්සේ අවසානය දක්වාම අපට මඟපෙන්වමින් අපව ගෙනයන සේක. උන්වහන්සේ අපගේ ක්‍රියාවන් දැක ඒ අනුව අපට ආශිර්වාද කරන සේක.

ප්‍රිය දෙවියන්වහන්සේගේ දරුවෙනි, ඔබගේ මනසකැමති වන්නාවූ දෙයට ඉඩ නොදී එලියා මෙන් ඔබ පවිත්‍ර වූ ජීවිතයක් ගත කිරීමත් දේව රාජ්‍යය තුළ ස්ථිරව සිටීමටත් ඔබ කැමතිද? හෝ ඔබ එලීෂා මෙන් යාච්ඤා කරමින් ඔබගේ ඇදහිල්ල තුළ ස්ථිරවම සිටිමින් ඔබගේ කැඳවීම තුළ බලවත්ව සිටිමින් හා ආලේපය දෙගුණයක් ඇතිව ජීවත් වීමට කැමතිද? එලීෂා මෙන් ඉතා ප්‍රඥාවන්තව දක්ෂතාවයන් ඇතිව සිටීමට කැමතිද? ඔබ එලීෂාව අනුගමනය කිරීමට කැමතිද? ***(ගීතාවලිය 119:98-100)***

හෝ, ඔබ ගෙහාසි වගේ ක්‍රියා කරනවාද? ඔහු මුදල් ලබා ගන්නා පිණිස සෑම තැනම දුවගොස් අවසානයේදී ඔහුගේ සේවය නැතකර ගත්තේය. ඔහුගේ ජීවිතයට ශාපය ලබාගත් අතර එම ශාපය ඔහුගේ පරම්පරාවලටම ගලා ගියේය. ඔබගේ අනාගතය තීරණය වන්නේ ඔබ ගන්නාවූ තීරණය මතයි. ඔබගේ පිළිතුර කුමක් ද?

***


## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

වාර්ෂික දායකත්වය - රු. 100/- ජීවිත දායකත්වය - රු. 2000/-

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරණකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරණකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.



**ECHO OF HIS CALL**

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852

E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com



**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**

on 2nd **JULY 2022.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**


***JESUS LOVES YOU!***

**To**

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**